(19)

# ද මැසනඩ් විද්‍යාලය

12 වන ශ්‍රේණිය 24 - 11 - 2016

**සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය**

I පත්‍රය කාලය පැ. 01

Learning Resource Center
R
De Mazenod College
Kandana

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) අන්තර්වර්ති සන්නිවේදනයේ දී පුද්ගලයා තොරතුරු රැස්කිරීම සඳහා යොදාගනු ලබන්නේ,
1. රූපවාහිනී මාධ්‍ය 2. ගුවන්විදුලි මාධ්‍ය 3. මුද්‍රිත මාධ්‍ය
4. පංචේන්ද්‍රිය 5. නව මාධ්‍ය (..........)

(02) පුද්ගලාන්තර සන්නිවේදනයෙහි කණ්ඩායම් සන්නිවේදනයට සාපේක්ෂව කැපී පෙනෙන ලක්ෂණය වන්නේ,
1. අවාචික සන්නිවේදනය ප්‍රබල වීම. 2. සන්නිවේදන හා ග්‍රාහක භූමිකා ස්ථාවර වීම.
3. එක් ග්‍රාහකයෙකු පමණක් සිටීම. 4. සුහදතාවය වර්ධනය වීම.
5. දෙපාර්ශවය ම දන්නා භාෂාවක් යොදා ගැනීම. (..........)

(03) සමාජයක් යන්න නිර්වචනය කිරීමේ දී ඊට අයත් නොවන අංගය වන්නේ,
1. නිශ්චිත දේශ සීමාවක් 2. ආගමික නිදහසක්
3. අන්තර් සබඳතා සහිත සමූහයක් 4. දේශපාලන ස්වාධීනත්වයක්
5. එකිනෙකා අතර අන්තර් සබඳතා මත ගොඩනැගුණු පිරිසක් (..........)

(04) ශ්‍රාව්‍ය ගවේෂණයේ දී භාවිත වන ශිල්ප ක්‍රමයක් නොවන්නේ,
1. නිරීක්ෂණය 2. විශ්ලේෂණය 3. සංස්ලේෂණය
4. නියෝජනය 5. සම්පරීක්ෂාව (..........)

(05) සන්නිවේදනයේ දී අර්ථ බාධාවක් වන්නේ,
1. අකුණු ගැසීම. 2. පෙනීමේ දුබලතාව.
3. මුද්‍රිත ප්‍රකාශනයෙහි ඡායාරූපය අපහැදිලි වීම. 4. මයික්‍රෆෝනය සුසර නොවීම.
5. ග්‍රාහකයාගේ භාෂා දැනුමේ දුබලතාව (..........)

(06) සන්නිවේදනය යනු ආන්තික ක්‍රියාවලියක් නොව අඛණ්ඩ චක්‍රාකාර ක්‍රියාවලියක් බව ආකෘතියකින් පෙන්වා දෙනු ලැබුවේ,
1. ෂැනන් වීවර් 2. කර්ට් ලෙවින් 3. ඩේවිඩ් කේ. බර්ලෝ
4. හැරල්ඩ් ඩී. ලැස්වෙල් 5. විල්බර් ශ්‍රාම් හා ඔස්ගුඩ් (..........)

(07) තොරතුරු සම්ප්‍රේෂණ ක්‍රියාවලියේ දී වාරණයට ලක්කිරීම අපහසු ජනමාධ්‍ය වන්නේ,
1. රූපවාහිනිය 2. පුවත්පත 3. ගුවන් විදුලිය
4. සිනමාව 5. අන්තර්ජාලය (..........)

(08) සමාජයක් යනු නිරන්තරයෙන් හැල හැප්පීම්වලට භාජනය වෙමින් විවිධ නව්කරණයන්ට හසුවෙමින් විකාශනය වන සංවිධානයකි. මෙම තත්ත්වය පැහැදිලි වන ප්‍රකාශය වන්නේ,
1. සමාජයක් යනු සමූහයකි.
2. සමාජය යනු ගතික සංවිධානයකි.
3. සන්නිවේදනයේ ප්‍රතිඵලයක් ලෙස සමාජය බිහිවිය.
4. සමාජය ක්‍රමික හා අක්‍රමික විකාශනයක ප්‍රතිඵලයකි.
5. සමාජය ස්වභාවික සංවිධානයකි (..........)

(09) ගෝලීයකරණයේ නව ප්‍රවණතාවයක් නොවන්නේ,

1. ජාතික රාජ්‍යයන් දුර්වල වීම.
2. මූල්‍ය ආර්ථිකය ශක්තිමත් වීම.
3. තාක්ෂණය ආර්ථිකයේ තීරණාත්මක බලවේගයක් වීම.
4. ජන සන්නිවේදන මාධ්‍යයන්ගේ සීමිත වර්ධනයක් සිදු වීම.
5. ගෝලීය තොරතුරු අවකාශයක් නිර්මාණය වීම. (..........)

(10) ජනමාධ්‍ය සංදේශ වාරණයට ලක්වීමේ ඉහළ ප්‍රවණතාවක් පවතිනුයේ,

1. නිදහස් මතවාදී සංකල්පය ක්‍රියාත්මක වීමේදී.
2. අධිපතිවාදී සංකල්පය ක්‍රියාත්මක වීමේදී
3. සමාජ වගකීම් සංකල්පය ක්‍රියාත්මක වීමේදී.
4. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය ක්‍රියාත්මක වීමේදී
5. සංවර්ධනාත්මක සංකල්පය ක්‍රියාත්මක වීමේදී. (..........)

(11) ව්‍යුහාත්මක සන්නිවේදන ආකෘතියක් යනු,

1. රේඛීය ආකෘතියකි.
2. විවිධ හැඩයන්ගෙන් යුතු ආකෘතියකි.
3. සන්නිවේදනය ද්වි මාර්ගිකව ගමන් කරන ආකෘතියකි.
4. සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය පෙන්නුම් කරන්නකි.
5. සන්නිවේදන විෂය හා සම්බන්ධ මූලික කරුණු පදනම් කරගත්තකි. (..........)

(12) නිර්වාචික සන්නිවේදනය ප්‍රබල ලෙස භාවිත වන මාධ්‍ය වනුයේ,

1. රූපවාහිනිය
2. සිනමාව
3. පුවත්පත
4. සමාජජාල
5. ගුවන්විදුලිය (..........)

(13) හැරල්ඩ් ඩී.ලැස්වෙල් ආකෘතිය මගින්,

1. ප්‍රතිපෝෂණය පිළිබඳ අවධානය යොමු නොකරයි.
2. මාධ්‍ය හා නාලිකාව නොසලකා හරියි.
3. ගණිතමය ලක්ෂණ පදනම් කරගනියි.
4. රේඛීය බව පෙන්නුම් කරයි.
5. සන්නිවේදන බාධක මත පදනම් වෙයි. (..........)

(14) අවාචික සන්නිවේදනයෙහි කාර්යයන් ඉදිරිපත් කරන ලද්දේ,

1. ශ්‍රාම් හා ඔස්ගුඩ්
2. නායර් හා වයිට්
3. ගලී හා ලෙදර්ස්
4. මාෂල් මැක්ලුහන්
5. කර්ට් ලෙවින් (..........)

(15) කිසියම් සන්නිවේදන වර්ගයක ලක්ෂණ පහත දැක්වේ,

A - විධිමත් සංවිධානාත්මක ව්‍යුහයක් පැවතීම.
B - බහුතර ග්‍රාහකයා වෙනුවෙන් සංදේශ නිකුත් කරයි
C - දොරටු පාලකයින් ගණනාවක් ක්‍රියාත්මක වේ.

ඉහත ලක්ෂණ දැකිය හැකිවන්නේ,

1. සමූහ සන්නිවේදනයෙහි.
2. අන්තර්වර්ති සන්නිවේදනයෙහි
3. අන්තර් පුද්ගල සන්නිවේදනයෙහි.
4. ජන සන්නිවේදනයෙහි
5. පුද්ගලාන්තර සන්නිවේදනයෙහි. (..........)

(16) දැනුම බෙදා ගැනීම, මග පෙන්වීම, ප්‍රශ්න විසඳා ගැනීම, තර්ජනය කිරීම වැනි අරමුණු ඉටු කර ගැනීමට සුදුසු සන්නිවේදන වර්ගය වන්නේ,

1. පුද්ගලාන්තර සන්නිවේදනය
2. සමූහ සන්නිවේදනය
3. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
4. ජන සන්නිවේදනය
5. වාචික සන්නිවේදනය (..........)

(17) සන්නිවේදනය හා මාධ්‍ය ක්‍රියාවලියට නිදහසේ හැසිරෙන්නට ඉඩ දිය යුතු බව අදහස් වන සන්නිවේදන සංකල්පය කුමක්ද?

1. සමාජ වගකීම් පිළිබඳ සන්නිවේදන සංකල්පය
2. සංවර්ධන සන්නිවේදන සංකල්පය
3. නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය
4. ප්‍රජාතන්ත්‍රීකරණ සන්නිවේදන සංකල්පය
5. සෝවියට් සමාජවාදී සන්නිවේදන සංකල්පය (..........)

24.11.2016 (20)
12 ශ්‍රේණිය
සන්නිවේදනය හා මාධ්‍ය

Learning Resource Centre
De Mazenod College
Kandana

(18) අවාචික සන්නිවේදන කාර්යයන් අතරට අයත් නොවන්නේ,
1. සංඥා හා ඉඟි නිසා උසස් සන්නිවේදන මට්ටමක් ඇති වේ.
2. වාචික සන්නිවේදනයේ අවාචික සන්නිවේදනය අවශ්‍ය නොවේ.
3. අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී අර්ථය තහවුරු කිරීමට උපකාරී වේ.
4. අර්ථයන් හා අභිප්‍රායයන් අවුලකින් තොරව ප්‍රකාශ කිරීමට හැකි වීමයි.
5. වාචිකව ඉදිරිපත් කරනවාට වඩා හැඟීම් හා භාවයන් ඉදිරිපත් කළ හැක. (..........)

(19) රදළයා හා ප්‍රවේණි දාසයා යන සමාජ පන්තිය හඳුනාගත හැකිවනුයේ,
1. ප්‍රාථමික සමාජයේය. 2. වැඩවසම් සමාජයේය. 3. වහල් සමාජයේය.
4. ධනවාදී සමාජයේය. 5. සමාජවාදී සමාජයේය. (..........)

(20) පුරවැසි මාධ්‍යවේදියා,
1. සෑම විටම අන්අය හා කථා බහ කරන්නෙකු විය යුතුය.
2. ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකු විය යුතුය.
3. තම ප්‍රදේශයේ ගැටලු පිළිබඳව පමණක් අවධානය යොමු කළ යුතුය.
4. වෘත්තිමය වශයෙන් මාධ්‍යකරණයෙහි නිරතවිය යුතුය.
5. සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවිය යුතුය. (..........)

(21) කිසියම් එක් ක්ෂේත්‍රයක් අතර පමණක් තොරතුරක් පැතිරවීමේදී සුදුසු වනුයේ,
1. තනි දාමය 2. පර්ෂද දාමය 3. ඕපාදූප දාමය
4. සම්භාවිතා දාමය 5. හරස් දාමය (..........)

(22) සන්නිවේදකයාගේ හා ග්‍රාහකයාගේ සමානත්වය සිය ආකෘතිය මගින් පැහැදිලි කර දීමට උත්සහ දරන ලද්දේ,
1. විල්බර් ශ්‍රාම් 2. හැරල්ඩ් ඩී ලැස්වෙල් 3. එඩ්වඩ් සැපීර්
4. ඩේවිඩ් කේ.බර්ලෝ 5. ෂැනොන් හා වීවර් (..........)

(23) වැඩකරන ජනතාවගේ විඥානය සකස් කිරීමට ජනමාධ්‍ය භාවිත කළ යුතු බව ප්‍රකාශවනුයේ,
1. අධිපතිවාදී සන්නිවේදන සංකල්පයෙනි. 2. නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පයෙනි
3. සංවර්ධන සන්නිවේදන සංකල්පයෙනි 4. සමාජ වගකීම් පිළිබඳ සන්නිවේදන සංකල්පයෙනි
5. සෝවියට් කොමියුනිස්ට් සන්නිවේදන සංකල්පයෙනි. (..........)

(24) සන්නිවේදනයේ මූලික හා අත්‍යවශ්‍ය පාර්ශවයක් නොවන්නේ,
1. සන්නිවේදන තාක්ෂණය 2. ග්‍රාහකයා 3. සංදේශය
4. මාධ්‍ය 5. සන්නිවේදකයා (..........)

(25) සමාජයක මූලික ස්වභාවය නිර්ණය කරන අංශ දෙක වන්නේ,
1. ව්‍යවසාය මූල අංශය හා කාර්මික අංශය 2. ප්‍රජා මූල අංශය හා ව්‍යවසාය මූල අංශය
3. කාර්මික අංශය හා ප්‍රජාමූල අංශය 4. සේවා අංශය හා කාර්මික අංශය
5. ආර්ථික අංශය හා දේශපාලන අංශය (..........)

(26) ඥාන ගවේෂණය පිළිබඳ සදොස් අදහස තෝරන්න.
1. ඥාන ගවේෂණය ඓතිහාසික සිද්ධියකි.
2. ඥාන ගවේෂණය විවිධ ශිල්පක්‍රම භාවිත කරයි.
3. ඥාන ගවේෂණයේ දී උද්ගාමී හා නිගාමී තර්ක ක්‍රම භාවිත කරයි.
4. ඥාන ගවේෂණය න්‍යායික ගවේෂණයේ ප්‍රතිඵලයක් පමණි.
5. ඥාන ගවේෂණය යනු ලෝකය අනාවරණය කර ගැනීමකි. (..........)

(27) විවිධ සන්නිවේදන අවස්ථාවල ප්‍රතිපෝෂණය සිදු වේ. එවැනි අවස්ථාවලට සාපේක්ෂව සන්නිවේදනයේ දී ප්‍රතිපෝෂණය සිදුවන්නේ,
1. බහුල හා ක්ෂණික ස්වරූපයෙනි. 2. සීමිත හා පමාවන ස්වරූපයෙනි.
3. සීමිත හා ක්ෂණික ස්වරූපයෙනි. 4. අතිශය සීමිත හා සාමාන්‍යයෙන් පමාවූ ස්වරූපයෙනි.
5. අතිශය බහුල හා සාමාන්‍යයෙන් ක්ෂණික ස්වරූපයෙනි. (..........)

# ද මැසනඩ් විද්‍යාලය

12 වන ශ්‍රේණිය

**සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය**

II පත්‍රය

කාලය පැ. 02

❖ ප්‍රශ්න තුනටම පිළිතුරු සපයන්න.

01. i. සන්නිවේදනය යනු කුමක්දැයි නිර්වචනයක් ඇසුරින් පහදන්න.

ii. ඔබ දන්නා සන්නිවේදන ආකෘතියක් රූපසටහනකින් විස්තර කරන්න.

iii. ඉහත සඳහන් කළ ආකෘතිය හැර වෙනත් සන්නිවේදන ආකෘති 2 ක් නම් කර ඒවායේ වෙනස්කම් 2 බැගින් ලියන්න.

iv. සන්නිවේදනයේ ස්වභාවය කරුණු 4 කින් පහදන්න.

023.i. ''තම පරපුරේ උරුමය නව පරපුරට කියා දීම සිදුවන්නේ සන්නිවේදනය මගිනි'' එක් පරපුරකට අලුතින් එක්වන සාමාජිකයා සමූහයේ අනන්‍යතාවය සහ අරමුණු අනාගතයට රැගෙන යාමට අනුගමනය කළ යුතු කරුණු 3 ක් සඳහන් කරන්න.

ii. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ඉටුකර ගත හැකි අරමුණු 3 ක් නම් කර අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී දෙපාර්ශවය දියුණු කළ යුතු සන්නිවේදන තත්වයන් 3 ක් ලියා විස්තර කරන්න.

iii. ජන සන්නිවේදනයේ ලක්ෂණ 4 ක් නම් කර ඉන් 2 ක් විස්තර කරන්න.

iv. ඉහත කොටසේ දී ඔබ සඳහන් කළ කරුණු 4 විශ්ව සන්නිවේදනයේ දී කවර ස්වරූපයක් ගනීද? පැහැදිලි කරන්න.

3. ''ඔබ ප්‍රදේශයේ කසල ප්‍රශ්නය නිසා ප්‍රදේශවාසීන් මහත් අපහසුතාවකට පත්ව සිටිති. මේ පිළිබඳව ඔවුන් අදාළ බල කේන්ද්‍රීය ආයතන වලට කිහිප වරක්ම දැනුම් දුන්නද තවම ප්‍රශ්නය විසඳී නැත. අවසානයේ දී ප්‍රදේශවාසීහු උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්වූහ. මෙය වාර්තා කිරීම සඳහා විවිධ ජනමාධ්‍යකරුවන් ඉදිරිපත් වූහ.

i. ප්‍රදේශවාසීන් විසින් උද්ඝෝෂණයේ දී භාවිතා කරන ද සන්නිවේදන ස්වරූප හතරක් නිදසුන් සමඟ ඉදිරිපත් කරන්න.

ii. ජනතාව හා බලකේන්ද්‍රීය ආයතන අතර ගැටලු වලදී ජන මාධ්‍ය මැදිහත් වන ආකාර දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

iii. ඔබ පුරවැසි මාධ්‍යකරුවෙකු ලෙස ක්‍රියා කරන්නේනම් ඔබ ඊට දායක වන අවස්ථා 4 ක් සඳහන් කරන්න.

iv. විකල්ප හා පුරවැසි මාධ්‍ය අතර වෙනස්කම් දෙකක් කෙටියෙන් සඳහන් කරන්න.